

(c) Sumitha Publishers

බරණැස් පුරයට නුදුරු ගමක
එක්තරා තාපසයෙක් වාසය කළේය.
ඔහුගේ හිස මුදුනේ
ගැටයක් සේ බැඳ තිබුණු කෙස් කළඹ
හැඩපලු ගෙතී තිබිණ.
දිග රැවුලකින් මුහුණේ අඩක් වැසී තිබිණ.
ඇඟ වැසී තිබුණේ
රළු රෙදිකඩකිනි.

ගමේ ගම්පතියා වනබද පෙදෙසක
කුඩා ආරාමයක් සදා
තාපසයාට භාර දුන්නේය.
ආහාර පාන ද ගම්පතියා විසින් ම සැපයිණා.
හොඳින් තවුස් දම් රකින්නට වුවමනා
හැම දෙයක් ම ගම්පතියාගෙන් ලැබිණා.


(c) Sumitha Publishers